(විරිණි)
(லட шத)
erved)

093689

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව Department of Examinations, Sri Lanka

**71 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2003 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2003

සිංහල I
சிங்களம் I
Sinhala I

පැ තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

* පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. (අ) පහත දක්වෙන ගද්‍ය පද්‍ය පාඨයන්හි **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන කෙරෙහි අවධානය යොමු කරමින් ඡේද භාවාර්ථ ලිහිල් බසින් ලියන්න. **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන සඳහා ඔබ දෙන අර්ථ යටින් ඉරි අඳින්න.

(i) බුදුහු ඉස්දෙර වැඩ සිට හුණුපැන් නහා ඉක්බිත්තෙන් භෝජනානුභවයක් කරවන්නා සේ එම්බල මහණ, යම් සේ දඬුඅතින් ප්‍රයෝජන ඇති මිනිස්සු වලට වැද ලා හැද කැති දඬු හැද හැති සැටියේ හා වස් දඬු වස් දඬුවන් සොයා ආ කෙනෙක් **තිසි ද්‍රව්‍යයක් ඉසැති කපා ගෙන** යත් මුත් කපා කළ දඬුකැබිලි ඒ මේ හැර කොටසක් පා අව ආදී වූ කිසිවකට ගත නොහැකි බැවින් කපා කළ දඬු කැබිලි ආදියටත් වඩා නිෂ්ප්‍රයෝජන ද එහෙයින් මේ ශරීරය රූ අරු දිවිදු නැති වන්නා ම ශ්‍රී යහන්වල හොත්තත් දවීම් ආදිය පැමිණෙයි.

නැතහොත්

සිවුදුවණියෝ ද ගල මුදුනේ සිට "බිලියම් කරන්නැ" යි කිවු ය. ඒ බැණ නොනැහෙන්නෙ ය. "බැණ නොනැහෙන්නේ හැයි ද" යි විචාළ හෙයින් "මට **බිලියමින් කම් නැත බිලියම් පිට ලා ලා** තොප මෙතැනට ගෙනෙන පිණිස යැ" යි කී ය. "කෙහාගේ හැයි ද" යි විචාළ කල්හි, "තොප මරාපියා ආභරණ හැර ගෙන පලායන්ට යැ" යි කී ය. ඌ තුමූ බා ගොසින් "ස්වාමීනි, මාත් ආභරණත් මුඹ සන්තක වූව මරන්නෙ හැයි ද? ආභරණත් හැර ගත මැනව. මා අතිනුත් මෙහෙ හැර ගත මැනැවැ" යි කිවු ය. ඒ කෙසේ කිවත් නො ගිවිස ම මරන්නට ම තක්වර ව ගත. "හැඟිවනු මැනව. මා මිය යාමෙන් ප්‍රයෝජන නැත. ආභරණ හැරගෙන මාගෙනුත් **කිසිකම්** හැර ගත මැනවැ" යි කිවු ය. ඒ අසා සොරා "එසේ කළ කලට නොපි ගොසින් දෙමව්පියන්ට කියාලව එසේ කලට අපට විනාසය කරත් ම යැ"යි කිවු ය.

(ii) එකල බුදුහු ආනන්දයෙනි, ඉවත් වව, ඉදිරියෙහි නොසිටුව යි වදළ සේක. දෙවෙනි වත් අනඳ මහ තෙරුන් වහන්සේ මේ ඇත් මිනී මරන චණ්ඩ පරුෂ ය. කෝපයෙන් දිලිහි **ප්‍රළයානලමණ්ඩලයෙක්** එන්නේ ය. පළමු කොට මා මරා පසු ව තුඹ වහන්සේ කරා එවයි කියා යාඥ කොට කියා ඉදිරියෙහි සිටි සේක. තුන්වෙනි වත් පැගවව ආනන්දයෙනි, ඒ ඇතු දමනයෙහි ලීම අපට භාර යැයි වදළදීත් **ස්නේහබන්ධනයෙන්** බැඳී ඉවත් ව යා නොහී සිටිනා හෙයින් බුදුන්ගේ ඍද්ධානුභාවයෙන් අනඳ මහ තෙරුන් වහන්සේ වැඩ සිටි භූමිය කුඹල් පසක් මෙන් කරකැවී පසු ව ගොස් භික්ෂූන් වහන්සේ මද්ධ්‍යයෙහි සිටුවා ලූ කල්හි එක් ස්ත්‍රියක් නාලාගිරියා දක මරන භයින් භීත ව දිවන්නී උකුළෙහි උන් දරුවන් ඇතුවත් සර්වඥයන් වහන්සේටත් අතුරේ දමා ගියා ය. ඇ ලුහුබැඳ ගෙන ගිය ඇත්, දරුවන් දක කරකැවී ආයේ ය. එකල ඒ කුමරුවා ඇතු තමා ළඟට එන්නා දක මහ හඬින් අඬන්නට පටන් ගත්තේ ය.

(iii) ඒ අසා ශක්‍රයෝ කියන්නෝ මම ශීලසංරක්ෂණය කරන කෙනෙකුන්ට ම දෙමි "තෙපි සිල් රකුද" යි විචාළෝ ය. එබස් ඇසූ මනුෂ්‍යයෝ "අපි සිල් රැකීම නම් කෙසේ වූ දෙයකැයි නො දනුම්හ. මිලයට දෙව" යි කීවාහු ය. "මට මිලයෙන් ප්‍රයෝජන නැත සිල් රක්ෂා කරන කෙනෙකුන්ට ම දෙමි" යි ශක්‍රයෝ කිවුය. මනුෂ්‍යයෝ මේ තෙම යම්කිසි **කළුවන්නෙකැයි** කියා ගියෝ ය. සුජාතාවෝ එපවත් අසා මට ගෙන එන ලද්දේ වනැයි ගොස් "ස්වාමීනි දුන මැනව" යි කී ය. "මැණියෙනි, සිල් රකු ද" යි විචාළෝ ය. "එසේ ය, රකිමි" කී කල්හි "මා විසින් මේ කැකිරි තොපට ම ගෙන එන ලද්දේ ය" යි කියා ගැල හා සමග ඇගේ ගේ දෙර තබා ගියෝ ය. ඒ ස්ත්‍රී ද **දිවිපමණින්** සිල් රක්ෂා කොට එයින් චුත ව වේපචිත්තිය නම් අසුරේන්ද්‍රයාට දූ ව උපන. සිල් රැකි අනුසසින් විශිෂ්ට රූ ඇති වූ ය.

[ දෙවෙනි පිටුව බලන්න.

(අ) පහත දැක්වෙන පදවලට මුල් වුණු ප්‍රකෘති රූප වෙන් කොට දක්වන්න.

(i) කිඹුල්ලු (ii) කන්දක් (iii) කකුළුවෝ

(iv) පැදුරක් (v) වැද්දෝ (vi) ළමයි

(ආ) පහත දැක්වෙන පද අතුරෙන් උක්ත පදත් අනුක්ත පදත් වෙන් කොට ලියන්න.

(i) විචාරකයෝ (ii) කම්කරුවකු (iii) බුද්ධිමත්තු

(iv) උපදේශකවරු (v) ලේඛිකාවක (vi) අප

(ඇ) පහත දැක්වෙන පදවලට අනුරූප පූර්ව ක්‍රියා පද ලියන්න.

(i) සපදයි (ii) බොලඹවයි (iii) මැරෙයි

(iv) බඳියි (v) බොයි (vi) දෙයි

(ඈ) පහත දැක්වෙන පදවල ඇතුළත් වන උපසර්ග වෙන් කොට දක්වන්න.

(i) අත්‍යන්ත (ii) උද්ගමන (iii) නිරර්ථක

(iv) ප්‍රවර්ධනය (v) සමාරම්භය (vi) දුරවබෝධ

(ඉ) පහත දැක්වෙන නාම පදවල ඇතුළත් වන තද්ධිත ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

(i) ගැමියෝ (ii) ගුණවත්තු (iii) සිටාණෝ

(iv) සාමාජිකයන් (v) තරුණියෝ (vi) චන්ද්‍රිකාව

(ලකුණු 15 යි.)

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **සදෝස් නැත් නම් නිදෝස් කොට** ලියන්න.

(i) අපි සෝක වන්නේ කෘතියේ චරිතයන් ගැනත් ඔවුන් පත් වන ඉරණම ගැනත් ය.

(ii) අගරදගුරුතුමා යැදහැවතුන් අමතයි.

(iii) නාමරයක මිල අධික නිසා ඔවුන් එහි නවාතැන් ගැනීමේ අදහස අත්හැරී

(iv) උපාධි අපෙක්ෂකයන් විසි දෙනෙකු නව පාඨමාලාව සඳහා තෝරා ගන්නා ලදී.

(v) සියලු ම ශ්‍රී ලාංකිකයන් සමගි සම්පන්න වේවා.

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා **සුදුසු පදය වරහන් තුළින්** තෝරා ලියන්න.

(i) (ගුරුවරයා / ගුරුවරුන්) වැඩි (දෙනෙක් / දෙනෙකු) පොත් කියවති.

(ii) (නායකයෝ / නායකයන්) සමාජයට ආදර්ශයක් (දෙයි. / දෙති. / දෙනු ලබති.)

(iii) (කුමාරතුංගයෝ / කුමාරතුංගයන්) ලියූ ව්‍යාකරණ විවරණය දනුදු (පාඨකයෝ / පාඨකයන්) කියවති.

(iv) (ශ්‍රී ලාංකිකයෝ / ශ්‍රී ලාංකිකයන්) සියලු දෙනා (සිංහලයන් / සිංහලයෝ) නො වෙති.

(v) (සරච්චන්ද්‍රයන් / සරච්චන්ද්‍රයෝ) සින්දු කියනවා (මා / මම) අසා නැත.

(ඇ) පහත දැක්වෙන වාක්‍ය **කර්ම කාරක** වාක්‍යවලට හරවන්න.

(i) ගායක ගායිකාවෝ රසිකයන් පිනවති.

(ii) ලේකම්වරියක් වාර්තාව සභාගත කළා ය.

(iii) අනාථ දැරිය ඇගේ සහෝදරියන් හඳුනා ගත්තා ය.

(iv) ගම්වැසියෝ මහත් හරසරින් මා පිළිගත්හ.

(v) භාෂාවෝ නව රීතීන් බිහි කරති.

(ලකුණු 15 යි.)

[ හතරවැනි පිටුව බලන්න.

www.artsapi.lk

• පහත දැක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) මොහඳුරට දිවාකර වූ
(ii) විලිකුන් සුරත් පල
(iii) පුරඳර නන්දන උයනක් සේ
(iv) නත් රිසි දෙන සිතුමිණ සේ
(v) පිබිදුණු මුත කොද
(vi) ධනු ශිල්පයෙහි හසළ රජ කුමරෙක්
(vii) සියලු ඓශ්වර්යයෙන් යුක්ත
(viii) ආහාර්යාභිනය බොහෝ විට ස්වාභාවික ය.
(ix) දෙස්සෑං බැවේ විචාරය
(x) පොල් ඔයනවා
(xi) කිරි අත්තා මොනවද බුත්තෙ ?
(xii) සකලයො අඹන්ට හේනට යමු
(xiii) බොරදියෙහි මාළු බාන්නා සේ
(xiv) වක්කඩේ හකුරු හැංගුවා සේ
(xv) ජීවන දෘෂ්ටිය සාර්වත්‍රික ය.

(ලකුණු 15 යි.)

7. (i) "ඉඩම් කඩම්" "මුදල් හදල්" "ළමයි බමයි" යන යුගල පද සැදී ඇත්තේ කෙසේ ද? මේ වර්ගයේ තවත් යුගල පද දෙකක් දක්වන්න.
(ii) "වැව් අමුණු" "මුතු මැණික්" "පොත් පත්" යන සමාස කවර වර්ගයට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද දෙකක් දක්වන්න.
(iii) "කළු ගල්" "කහ කුරුල්ලා" "රත් කෙහෙල්" යන සමාස කවර වර්ගවලට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද දෙකක් දක්වන්න.
(iv) "මුව කමල" "හද විල" "ජීවන නෞකාව" වැනි යෙදුම් සැදී ඇති ආකාරය පැහැදිලි කරන්න. මේ වර්ගයේ තවත් යෙදුම් දෙකක් දක්වන්න.
(v) 'සුරිඳු' 'දිනිඳු' 'නෙරිඳු' යන පද සන්ධි වී ඇත්තේ කෙසේ ද? ඒ අයුරින් ම සන්ධි වී ඇති තවත් පද දෙකක් දක්වන්න.

(ලකුණු 15 යි.)

8. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
(i) සඤ්ඤක අක්ෂර
(ii) නිපාත ක්‍රියා
(iii) 'තෙමේ' හා 'තොමෝ' යන පද
(iv) සිනා උපදවන ප්‍රස්තාව පිරුළු පහක් ලියා ඉන් එකක් විස්තර කරන්න.
(v) කිසිවකු කතා බස් කරන ආකාරයෙන් ඔහු හෝ ඇය හෝ හැදී වැඩුණු ප්‍රදේශය ද දැන ගත හැකි බවට නිදසුන් පහක් දෙන්න.
(vi) යුරෝපීය භාෂා සිංහලයට බලපෑ ආකාරය.

(ලකුණු 15 යි.)

* * *

www.artsapi.lk

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved /

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**71 S II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
## கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2003 ஏப்பிரல்
## General Certificate of Education (Adv. Level) Examination, April 2003

**සිංහල II**
**சிங்களம் II**
**Sinhala II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

* 1, 2, 3, ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. පහත දැක්වෙන ව්‍යුහගත ඡේද අතුරෙන් එකක් තෝරා ගෙන රචනාවක් ලියන්න.

(i) පාඨශාලාවල හා විශ්වවිද්‍යාලයවල විනය බෙහෙවින් පිරිහී ඇති බව අසන්නට දකින්නට ලැබේ. මේ තත්ත්වය උද්වීමට හේතු කවරේ ද? මේ තත්ත්වය මඟ හැර ගැනීමට ඇති උපාය මාර්ග මොනවා ද? ඒ උපාය මාර්ගවල ප්‍රායෝගිකභාවයත් ඵලදායිත්වයත් සැලකිල්ලට ගනිමින් 'ශිෂ්‍ය විනය' පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ පනස් පස්වැනි නිදහස් සමරුවත් අවසන් විණ. අපට ලැබුණු නිදහසින් අපේ රට ස්වාධීන ජාතියක් බවට පත් වී ඇද්ද? අපගේ දේශයෙහි විසඳ ගත යුතු ගැටලු තවමත් තිසි පරිදි විසඳී නැතැයි සමහරු කියති. මෙහි සත්‍යාසත්‍යතාව කුමක් ද? ස්වාධීන ජාතියක අනන්‍යතාව පිළිබිඹු කරන ලක්ෂණ වශයෙන් ඔබ දකින්නේ කුමක් දැයි පැහැදිලි කරමින් අපගේ මීළඟ පියවර විය යුත්තේ කුමක් දැයි සාකච්ඡා කරන්න.

(iii) ආයුධ නිෂ්පාදනය ලෝකයේ විශාල ම වාණිජ ව්‍යාපාරයක් බවට පත් වෙමින් පවතී. න්‍යෂ්ටික සිට රසායනික ආයුධ ගැන ද අසන්නට ලැබේ. ආයුධ නිෂ්පාදනය ලෝක සාමය ඇති කිරීමට උපකාරී වේ ද? ආයුධ නිෂ්පාදනය හා ලෝක සාමය අතර පවතින්නේ කෙබඳු සම්බන්ධතාවක් දැයි හෙළි කරමින් 'ලෝක සාමය' පිළිබඳ ගැටලුව විවරණය කරන්න.

(iv) සාහිත්‍යයක ප්‍රගමනය සඳහා අවශ්‍ය මූලික අංගයක් වන්නේ සාහිත්‍ය විචාරයයි. සිංහල සාහිත්‍යය අරබයා සුදුසු විචාර ක්‍රමයක් තවමත් පහළ වී නැතැයි සමහරු කියති. ඒ ඒ දේශවල සාහිත්‍ය අරබයා වෙන් වෙන් වශයෙන් ගත යුතු සාහිත්‍ය විචාර ක්‍රම තිබේ ද? එසේ නැතහොත් සාහිත්‍ය විචාරය යනු සියලු සාහිත්‍ය නිර්මාණ සඳහා පොදු මූල ධර්ම පද්ධතියක් ද? මෙරට පවත්නා සාහිත්‍ය විචාර ක්‍රමය පිළිබඳ ඇගයීමක් කරමින් මෙහි සත්‍යාසත්‍යතාව විමසන්න.

(v) බක් මහේ දී පැවැත්වෙන අලුත් අවුරුදු උත්සවයෙහි දී සාම්ප්‍රදායික ජන ක්‍රීඩා සමූහයකට සහභාගි වීමේ අවස්ථාව මහ ජනතාවට ලැබේ. මේ ජන ක්‍රීඩා අතුරෙන් **එකක්** තෝරා ගෙන, එය පැවැත්වෙන ආකාරය පියවරින් පියවර විස්තර කොට එමගින් පැලසෙන සාමාජික අර්ථය පැහැදිලි කරන්න.

(vi) චිත්‍රපටය, කලා නිර්මාණයක් වශයෙන් මෙන් ම ජන මාධ්‍යයක් වශයෙන්ද වැදගත් සාමාජික කර්තව්‍යයක් ඉටු කරයි. එහෙත් අද නිෂ්පාදනය වන චිත්‍රපට වැඩි කොටසක් "වැඩිහිටියන්ට පමණක්" සීමා කොට ප්‍රදර්ශනය කෙරේ. එසේ වූ කල චිත්‍රපටයෙන් ඉටු විය යුතු සාමාජික කාර්යභාරය මුළු මහත් සමාජය වෙනුවෙන් ඉටු වන බවක් නොපෙනේ. චිත්‍රපටය යළිත් වරක් සාමාජික මෙහෙවරක යෙදවීම සඳහා ගත යුතු පියවර කවරේ දැයි විමසන්න.

(ලකුණු 25 යි.)

[ දෙවෙනි පිටුව බලන්න.

2. (අ) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වක්‍රෝක්තිය වූ කලී කාව්‍යයේ යෙදෙන අලංකාරයන්හි පමණක් නොව කාව්‍ය පුරා පවතින මුඛ්‍ය ලක්ෂණ ය යනු භාමහගේ විශ්වාසයයි. කාව්‍යය අවශේෂ ලේඛනයෙන් වෙන් කොට ගැනීම වක්‍රෝක්තිය පදනම් කොට ගෙන සිදු වන්නකි. ඉතිහාසය, ශාස්ත්‍රාදී ලේඛන වක්‍ර භාෂණයෙන් තොර සෘජු උක්ති ක්‍රමයක් අනුගමනය කරන රචනා වේ. කාව්‍යය අලංකාරොක්තීන්ගේ මාර්ගයෙන් වක්‍රෝක්තිය ගුරු කොට ගනී. "කිසියම් අදහසක් හුදෙක් වාචනා මාර්ගයෙන් ප්‍රකාශ කිරීමෙන් වචනයේ ශොභාවක් - කාව්‍යමය චමත්කාරයක් - හට නොගනී. එබඳු ශොභාවක් ඇති කරවනුයේ වක්‍රෝක්ති නම් උක්ති ක්‍රමය මගිනි"යි භාමහ පවසයි. වක්‍රෝක්තියෙන් තොර වූ වර්ණනා ක්‍රමය භාමහ හඳුන්වන්නේ වාර්තා නමිනි. වාර්තා යනු කාව්‍ය තත්ත්වයට පත් නො වන ශාස්ත්‍ර ඉතිහාසාදී වශයෙන් යමක් සිදු වූ සැටියෙන් ම පවසන වර්ණනා ක්‍රමය වේ. "සූර්යයා බැස ගියේ ය. හඳ බබළයි. පක්ෂීහු කැදලි කරා යෙත්" වැනි කියුම් කාව්‍ය නොවේ. ඒවා හුදෙක් වාර්තා පමණි. වක්‍රෝක්තියකට නොනැඟූ සෘජු භාෂණ බැවිනි."

(i) මේ ඡේදයෙහි දැක්වෙන ආකාරයට 'වාර්තාව' යනු කුමක් ද?

(ii) වාර්තා කථනය චමත්කාරයක් උපදවන්නේ නැත්තේ ඇයි?

(iii) කාව්‍යය පුරා පවතින ප්‍රධාන ලක්ෂණය කුමක් ද?

(iv) "උක්ති ක්‍රමය" යන්නෙන් කුමක් අදහස් කෙරේ ද?

(v) "හිරු බැස යයි. සඳ බබළයි. පක්ෂීහු කැදලි කරා යෙත්" යන කියුම් කාව්‍යමය සන්ධ්‍යා වර්ණනයක් හැටියට ගත හැකි ද?

(ලකුණු 10 යි.)

(ආ) ඔබේ විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ප්‍රවීණ ලේඛකයකුට හෝ ප්‍රවීණ ලේඛිකාවකට හෝ ආරාධනය කිරීමට තීරණය කෙරේ. ඔහු හෝ ඇය හෝ සභාවට හඳුන්වා දීමේ කථාව ඔබට පැවරිණැයි සිතන්න. විනාඩි පහකට පමණ සීමා වන ඒ කථාවේ පිටපත සකස් කරන්න. කථාවේ ආරම්භය හා අවසානය ද විධිමත් ලෙස දක්වන්න.

(ලකුණු 15 යි.)

3. (අ) පහත දැක්වෙන එක් එක් වාක්‍යයක එක් පදයක අක්ෂර වින්‍යාසය සදෝස් ය. ඒ පදය පමණක් නිවැරැදි කොට ලියන්න.

(i) පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ විශිෂ්ඨ සේවා උදෙසා සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවයක් මහජන පුස්තකාලයෙහි පැවැත්විණ.

(ii) කුඩා පැලකින් ආරම්භ වුණු පැල තවාන දැන් සියලු වාර්තා බිඳ හෙළන වාණිජ ව්‍යාපෘතියක් බවට පත් වී ඇත.

(iii) ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යවල භාවිත වන භාෂා විලාසය නිසා සිදු වන පිරිහීම ව්‍යශ්‍යය දනාවනසුලු ය.

(iv) රටක ජනගහණය පාලනය කිරීම නැණ නුවණ මෙහෙයවා කළ යුතු වූ දූරදර්ශී කර්තව්‍යයක් බව සැලකුව මනා ය.

(ආ) පහත දැක්වෙන පද අකාරාදි පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

සත්, සඳ, ලිහු, විබත්, සමස්, පියෙවි, පස, කිරිය, ලොප්, අදෙස්, අගම්

(ඇ) පහත දැක්වෙන පද සන්ධි කරන්න.

(i) ජාති අනුරාගය (ii) හේතු අර්ථය

(iii) වන ඖෂධ (iv) අමාත්‍ය අංශය

(ඈ) පහත දැක්වෙන පද විසන්ධි කරන්න.

(i) අන්වර්ථ (නාමය) (ii) අභ්‍යවකාශ (තරණය)

(iii) මහින්දගමනය

(ඉ) 'ඉතිහාස' යන්නෙන් 'ඓතිහාසික' යන පදය සෑදෙන්නාක් සෙයින් 'සිද්ධාන්ත' යන්නෙන් සෑදෙන පදය කුමක් ද?

(ඊ) 'තරුණ' යන්නෙන් 'තාරුණ්‍යය' සෑදෙන්නාක් සෙයින් 'බහුල' යන්නෙන් සෑදෙන පදය කුමක් ද?

(උ) 'පියාණෝ' යන පදයෙහි ඇතුළත් තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?

(ඌ) 'සුපින්වත්' යන පදයෙහි ඇතුළත් උපසර්ගය කුමක් ද?

(එ) පහත දැක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) දේශ දේශාන්තරවල ඇවිද්ද ඔහු (ii) අනාරාධිත අමුත්තෙක්

(ඒ) පහත දැක්වෙන වාක්‍යවල සදෝස් තැන් ඇතොත් නිදෝස් කරන්න.

(i) සෞන්දර්ය සිද්ධාන්තය ගත්තත් මේ වෙනස පදනම් කොට ගෙන මෙසේ තර්ක කරත්.

(ii) කිසියම් විෂය ක්ෂේත්‍රයක මුල් තැන ගන්නා ප්‍රවීණයන් 'සක්විති' යන පදයෙන් හඳුන්වනු ලැබේ.

(ලකුණු 20 යි.)

[ තුන්වැනි පිටුව බලන්න.

www.artsapi.lk

4. (අ) පහත දැක්වෙන පදවලට මුල් වූ ප්‍රකෘති රූප වෙන් කොට දක්වන්න.

(i) කිඹුල්ලු (ii) කන්දක් (iii) කකුළුවෝ

(iv) [illegible] (v) වැද්දෝ (vi) ළමයි

(ආ) පහත දැක්වෙන පද අතුරෙන් උක්ත පදත් අනුක්ත පදත් වෙන් කොට ලියන්න.

(i) විචාරකයෝ (ii) කම්කරුවනු (iii) බුද්ධිමත්හු

(iv) උපදේශකවරු (v) ලේඛිකාවන (vi) අප

(ඇ) පහත දැක්වෙන පදවලට අනුරූප පූර්ව ක්‍රියා පද ලියන්න.

(i) සසඳයි (ii) පොලඹවයි (iii) මැරෙයි

(iv) බඳියි (v) බොයි (vi) දෙයි

(ඈ) පහත දැක්වෙන පදවල ඇතුළත් වන උපසර්ග වෙන් කොට දක්වන්න.

(i) අත්‍යන්ත (ii) උද්ගමන (iii) නිරර්ථක

(iv) ප්‍රවර්ධනය (v) සමාරම්භය (vi) දුරවබෝධ

(ඉ) පහත දැක්වෙන නාම පදවල ඇතුළත් වන තද්ධිත ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

(i) ගැමියෝ (ii) ගුණවත්හු (iii) සිටාණෝ

(iv) සාමාජිකයන් (v) තරුණියෝ (vi) චන්ද්‍රිකාව

(ලකුණු 15 යි.)

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල සදෝස් තැන් ඇතොත් නිදෝස් කොට ලියන්න.

(i) අපි සෝක වන්නේ කෘතියේ චරිතයන් ගැනත් ඔවුන් පත් වන ඉරණම ගැනත් ය.

(ii) අගරදගුරුතුමා සැදැහැවතුන් අමතයි.

(iii) කාමරයක මිල අධික නිසා ඔවුන් එහි නවාතැන් ගැනීමේ අදහස අත්හරී

(iv) උපාධි අපේක්ෂකයන් විසින් දෙනෙකු නව පාඨමාලාව සඳහා තෝරා ගන්නා ලදී.

(v) සියලු ම ශ්‍රී ලාංකිකයන් සමගි සම්පන්න වේවා.

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (ගුරුවරයා / ගුරුවරුන්) වැඩි (දෙනෙක් / දෙනෙකු) පොත් කියවති.

(ii) (නායකයෝ / නායකයන්) සමාජයට ආදර්ශයක් (දෙයි. / දෙති. / දෙනු ලබති.)

(iii) (කුමාරතුංගයෝ / කුමාරතුංගයන්) ලියූ 'ව්‍යාකරණ විවරණය' දනුදු (පාඨකයෝ / පාඨකයන්) කියවති.

(iv) (ශ්‍රී ලාංකිකයෝ / ශ්‍රී ලාංකිකයන්) සියලු දෙනා (සිංහලයන් / සිංහලයෝ) නො වෙති.

(v) (සරච්චන්ද්‍රයන් / සරච්චන්ද්‍රයෝ) සින්දු කියනවා (මා / මම) අසා නැත.

(ඇ) පහත දැක්වෙන වාක්‍ය **කර්ම කාරක** වාක්‍යවලට හරවන්න.

(i) ගායක ගායිකාවෝ රසිකයන් පිනවති.

(ii) ලේකම්වරියක් වාර්තාව සභාගත කළා ය.

(iii) අනාථ දැරිය ඇගේ සහෝදරියන් හඳුනා ගත්තා ය.

(iv) ගම්වැසියෝ මහත් හරසරින් මා පිළිගත්හ.

(v) භාෂාවෝ නව රීතීන් බිහි කරති.

(ලකුණු 15 යි.)

[ හතරවෙනි පිටුව බලන්න.

www.artsapi.lk

6. පහත දැක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) මොහඳුරට දිවාකර වූ

(ii) විලිකුන් සුරත් පල

(iii) පුරඳර නන්දන උයනක් සේ

(iv) නන් රිසි දෙන සිතුමිණ සේ

(v) පිබිදුණු මන කොඳ

(vi) ධනු ශිල්පයෙහි හසළ රජ කුමරෙක්

(vii) සියලු ඓශ්වර්යයෙන් යුක්ත

(viii) ආහාර්යාභිනය බොහෝ විට ස්වාභාවික ය.

(ix) දෙඤ්ඤං බැටේ විචාරය

(x) පොල් ඔයනවා

(xi) කිරි අත්තා මොනවද බුත්තෙ ?

(xii) සකලයො අඹන්ට යෝනට යමු

(xiii) බොරදියෙහි මාළු බාන්නා සේ

(xiv) වක්කඩේ හකුරු හැංගුවා සේ

(xv) ජීවන දෘෂ්ටිය සාර්වත්‍රික ය.

*(ලකුණු 15 යි.)*

7. (i) "ඉඩම් කඩම්" "මුදල් හදල්" "ළමයි බමයි" යන යුගල පද සෑදී ඇත්තේ කෙසේ ද? මේ වර්ගයේ තවත් යුගල පද **දෙකක්** දක්වන්න.

(ii) "වැව් අමුණු" "මුතු මැණික්" "පොත් පත්" යන සමාස කවර වර්ගයට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද **දෙකක්** දක්වන්න.

(iii) "කළු ගල්" "කහ කුරුල්ලා" "රත් කෙහෙල්" යන සමාස කවර වර්ගවලට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද **දෙකක්** දක්වන්න.

(iv) "මුව කමල" "හද විල" "ජීවන නෞකාව" වැනි යෙදුම් සෑදී ඇති ආකාරය පැහැදිලි කරන්න. මේ වර්ගයේ තවත් යෙදුම් **දෙකක්** දක්වන්න.

(v) 'සුරිඳු' 'දිනිඳු' 'කෙරිඳු' යන පද සන්ධි වී ඇත්තේ කෙසේ ද? ඒ අයුරින් ම සන්ධි වී ඇති තවත් පද දෙකක් දක්වන්න.

*(ලකුණු 15 යි.)*

8. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **තුනක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) සඤ්ඤක අක්ෂර

(ii) විධි ක්‍රියා

(iii) 'තෙමේ' හා 'තොමෝ' යන පද

(iv) සිනා උපදවන ප්‍රස්තාව පිරුළු **පහක්** ලියා ඉන් **එකක්** විස්තර කරන්න.

(v) කිසිවකු කතා බස් කරන ආකාරයෙන් ඔහු හෝ ඇය හෝ හැදී වැඩුණු ප්‍රදේශය ද දැන ගත හැකි බවට නිදසුන් **පහක්** දෙන්න.

(vi) යුරෝපීය භාෂා සිංහලයට බලපෑ ආකාරය.

*(ලකුණු 15 යි.)*

* * *

www.artsapi.lk